# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එස්පීඑල්ජී/කේජී/ඒ/වයිපීඑස්/එෆ්ඒ/05/2023/22

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2023 මැයි 21 දින

11 JUN 2024

ලේකම්,

යටියන්තොට ප්‍රාදේශීය සභාව.

**යටියන්තොට ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ටී.පී.එම්. කුමානායක

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට.

පිටපත :- පළාත් පාලන කොමසාරිස්, සබරගමුව පළාත් සභාව - කා.දැ.පි.

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. } එස්පීඑල්පී/කේපී/ඒ/වයිපීඑස්/එෆ්ඒ/05/2023/33

ඔබේ අංකය / உமது இல. / Your No }

දිනය / திகதி / Date } 2024 මැයි 31 දින

ලේකම්,

යටියන්තොට ප්‍රාදේශීය සභාව.

**යටියන්තොට ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

1 මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

යටියන්තොට ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට යටියන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2022 වර්ෂය වෙනුවෙන් කර්මාන්ත 06 ක් සඳහා ගිවිසුම්ගත වී නොතිබියදී සහා අරමුදලින් රු.953,413 ක් ණයහිමි වෙන්කිරීම් සිදුකිරීම නිසා එම ප්‍රමාණයෙන් ලාභය අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2021 වර්ෂයේ දී ගිවිසුම්ගත වී තිබුණු නමුත් 2023 වර්ෂය සඳහා අවිච්ඡේද කර නොතිබූ කර්මාන්තයකට හා 2023 වර්ෂයේදී රැඳවුම් මුදල් ද ගෙවා තිබුණු කර්මාන්ත 02ක් සඳහා රු.1,167,217ක් පළාත් සභා කර්මාන්ත ණයහිමි හා ණයගැති ලෙස වෙන්කිරීම් සිදුකිරීම නිසා එම ප්‍රමාණයෙන් කර්මාන්ත ණයහිමියන් හා ණයගැතියන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ගේට්ටුවක් හා හරිතාගාරයක් ඉදි කිරිමට වැය කළ රු.283,340ක් ස්ථාවර වත්කම් ලෙස නොදක්වා වියදමක් ලෙස කපා හැරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ස්ථාවර වත්කම් අඩුවෙන්ද වියදම් වැඩියෙන්ද දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු වෙන්කිරීම් කර නොතිබුණි.

(ඉ) ලැබිය යුතු ආදායම් ආධාර රු.35,000 ක් ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී ලෙස දක්වා තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී ආදායම වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශන අනුව, පොදු ගබඩා ගිණුම් ශේෂය හා උපලේඛන අනුව එම ශේෂය අතර රු.10,250 ක නොසැසඳීමක් පැවැතිණි.

(උ) මූල්‍ය ප්‍රකාශන අනුව හිඟ සේවක ණය ශේෂයක්, සේවක ණය ලේඛනය හා සැසඳීමේදී රු.45,797 ක වෙනසක් විය.

(ඌ) මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා 2023 භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ශේෂ අතර රු.6,369 ක නොසැසඳීමක් විය.

(ඉ) එකතුව රු. 294,348,584 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛන, ණයගැති ලේඛන, ණයහිමි ලේඛන හා කලින් ලැබීම් ලේඛනය ඉදිරිපත්කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශකරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) පනතේ 6 (1) (ආ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.5 අනුකූල නොවීම

-----------------

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

--------------------------------------------------------------------

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 20 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2)(අ) | තත්කාර්ය අතුරු අග්‍රිමයක් අදාළ කාර්යය නිම කළ විගසම පියවිය යුතු වුවත්, අවස්ථා 05ක දී රු.55,467ක් දින 04ත් හා දින 29ත් අතර කාල පමාවකින් ද, බිල්පත්වලින් පියවීම් අවස්ථා 18ක දී රු.421,224ක් දින 14ත් දින 40ත් අතර කාල පමාවකින් ද යුතු ව පියවා තිබුණි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 8.1 වගන්තිය | වාහන 05ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. |
| (ඇ) | අංක 2235/54 හා 2021 ජූලි 08 දිනැති ගැසට් පත්‍රයේ රාජ්‍ය සභාවේ 1978 අංක 48 දරන නාගරික සංවර්ධන පනතේ 83(1) වගන්තිය | 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ලද අනුමත අයදුම්පත් 67 න් අයදුම්පත් 44 ක් සඳහා, අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. එය ලද අයදුම්පත් සංඛ්‍යාවෙන් සියයට 65 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. |
| (ඈ) | 2010 මාර්තු 24 දිනැති අංක 08/2010 දරන පළාත් පාලන ප්‍රතිසංස්කරණ | සභාවට අයත් අක්කර 06 පර්චස් 8.65 ක සුසාන භූමි 07ක්, සුසාන භූමි ලෙස ප්‍රකාශයට පත්කර නොතිබුණි. එමෙන්ම, එම ඉඩම්වල අයිතිය පවරාගෙන ගිණුම්ගත |

| | |
|---|---|
| චක්‍රලේඛ මාර්ගෝපදේශ සංග්‍රහය | කිරීමටත්, වැටවල් යොදා ආරක්ෂා කිරීමටත් කටයුතු කර නොතිබිණි. |
| (ඉ) පළාත් පාලන ප්‍රතිසංස්කරණය පිළිබඳ පර්යේෂණ කොමිෂන් සභා වාර්තාවේ 14.3 වගන්තිය ප්‍රකාරව | අනවසර ඉදිකිරීම් පිළිබඳ ලැබෙන පැමිණිලි එක් එක් කරුණු අනුව වෙන් වෙන්ව ගොනු පවත්වා නොතිබුණු බැවින් විසඳුණු හා නොවිසිඳුණු පැමිණිලි පිළිබඳ තහවුරු කරගත නොහැකි විය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 15,889,217 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 17,784,468 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත්කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 4,598,013 | 5,159,810 | 5,467,151 | 897,194 | 4,306,642 | 4,475,968 | 4,262,495 | 1,204,536 |
| (ii) | කුලී | 10,096,800 | 11,336,148 | 11,209,228 | 191,307 | 8,479,900 | 7,874,817 | 8,417,067 | 153,951 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 850,020 | 1,162,116 | 1,162,116 | - | 850,050 | 957,409 | 967,009 | - |
| (iv) | වෙනත් ආදායම් | 2,550,000 | 9,149,671 | 9,952,665 | 932,617.62 | 5,139,700 | 8,413,354 | 7,458,054 | 1,204,735 |
| | | 18,094,833 | 26,807,745 | 27,791,161 | 2,021,119.81 | 18,776,292 | 21,721,548 | 21,104,625 | 2,563,222 |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-------------------------------------

(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ ආදායම රු.2,563,222 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු. 26,807,745 ක් විය. ඒ අනුව වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.29,370,967 ක් වුවද, රැස් කරන ලද ආදායම රු. 27,791,161 ක් වීමෙන් තවදුරටත් රැස්කළ ගතයුතු සමස්ථ ආදායම ප්‍රතිශතයක් ලෙස සියයට 5.38 ක මට්ටමක පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කළ ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු, කුලී ,බලපත්‍ර ගාස්තු, වරෙන්තු හා දඩ, වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්ගෙන් රැස්කළ ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 18.9 කින්, 11.02 කින් ,36.72 කින් ,761.32 කින් හා 280.88 කින් වැඩි වී තිබුණි.

2.2.3 වරිපනම් හා බදු

------------------

(අ) වරිපනම්

----------

සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන හා උපයෝගී ලේඛන අනුව අයවිය යුතු වරිපනම් බදු ශේෂය රු.851,029 ක් වූ අතර, එම හිඟය තුළ වර්ෂ 01 ට වැඩි හා වර්ෂ 04 ට අඩු ශේෂවල වටිනාකම රු.427,537 ක් විය.

(ආ) අක්කර බදු

------------

සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන හා උපයෝගී ලේඛන අනුව අයවිය යුතු අක්කර බදු ශේෂය රු.59,121 ක් වූ අතර, එම හිඟය තුළ වර්ෂ 01 ත්, 04 ත් අතර අයවිය යුතු රු.33,111 ක ශේෂයක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්ය සාධනය

--------------------

ප්‍රාදේශිය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු, උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුව විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරිම පිළිබදව නිරික්ෂණය වු කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම

-------------------

වැඩසටහන් 19 කට අදාළව හඳුනාගත් උප ක්‍රියාකාරකම් 83 කින් ක්‍රියාකාරකම් 35 ක් ඉටුකිරීමට සභාව අපොහොසත් වී තිබුණි.

3.2. කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මෝටර් රථ හා කරත්ත උපලේඛනය යටතේ දක්වා ඇති රු.600,147ක් වූ ටෙලර් යන්ත්‍රයක් හා අත් කරත්ත 02 ක් ස්ථාවර වත්කම් ලේඛනයේ වෙනුවට ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සටහන් කර තිබුණි.

(ආ) 2015 වර්ෂයේ සිට ලැබිය යුතු ආදායම් ආධාර රු.35,000 ක් අයකර නොතිබුණි.

(ඇ) සුසාන භූමි සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන නොතිබුණි.

(ඈ) බැකෝ යන්ත්‍රයක අක්‍රියව පැවති කාලය සඳහා අභාවිත සහතිකයක් ලබා නොගැනීම නිසා රු.143,704 ක් ආදායම් බලපත්‍ර ගාස්තු හා රක්ෂණ ගාස්තු ලෙස ගෙවා තිබුණි.

(ඉ) වසර 01ත් වසර 02 ත් අතර පැරණි රු.2,408,154 ක ණයහිමි ශේෂ පැවතුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත කරුණු නිරික්ෂණය විය.

(අ) සමීක්ෂණයේදී ව්‍යාපාර 235 ක් හඳුනාගෙන තිබුණද, ව්‍යාපාර බදු ලේඛනය අනුව ආයතන 243 කින් බදු මුදල් ලැබී තිබුණි. ඒ අනුව ව්‍යාපාර ඒකක 08ක් හඳුනා නොගැනීම නිසා ව්‍යාපාර සමීක්ෂණයේ නිවැරදිතාව ප්‍රශ්ණගත විය.

(ආ) වෙළඳ බලපත්‍ර සමීක්ෂණය අනුව 2023 වර්ෂයේ ව්‍යාපාර 349 ක් හඳුනාගෙන තිබුණද, එම ලේඛනය අනුව ආයතන 388 ක් පැවතිණි. ඒ අනුව ව්‍යාපාර ඒකක 39 ක් හඳුනා නොගැනීම නිසා එම සමීක්ෂණයේ නිවැරදිතාව ප්‍රශ්නගත විය.

(ඇ) ආයතන 16කින් පාරිසරික බලපත්‍ර ගාස්තු අය නොකිරීම නිසා රු.72,000ක් සභාවට අහිමි වී තිබුණි.

(ඈ) පිල්ලෑවේන ඉඩමෙන් පොදු කටයුතු සඳහා ලද හෙක්ටයාර් 0.404 ක් භූමියේ අනවසර ඉදිකිරීම් හා වගා සිදුකර තිබුණි.

(ඉ) තවට, සෙක්කුවත්ත සුසාන භූමිය හා පෙර පාසල පිහිටි හෙක්ටයාර් 0.2161 ක් වූ ඉඩමේ පොල්ගස් 08 ක් හා පුවක් ගස් 12 ක් තිබුණ ද, ඉන් ආදායම් ඉපයීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ඊ) 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා අනතුරුදායක ගස් කපා ඉවත් කිරීමට ලද අයදුම්පත් 1880කින් විසඳුම් ලබා දී නොමැති සංඛ්‍යාව 136ක් වූයෙන් එය ප්‍රතිශතයක් ලෙස සියයට 72 පමණ ඉහළ ප්‍රතිශතයක් ගෙන තිබුණි.

3. 4 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) තනතුරු 09 ක පුරප්පාඩු 20 ක් 2014 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලයක සිට පවතී.

(ii) වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුර සඳහා සේවා ගිවිසුම් මත 70 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(iii) 2023 වර්ෂයේ පත් වීම් ලද ඖෂධ සංයෝජකට අදාළ පුහුණුවීම් කිසිවක් ලැබී නොතිබුණු අතර ඔහු සතු සුදුසුකම් වූයේ, රියදුරු බලපත්‍රයක් හා අ.පො.ස (සාමාන්‍ය පෙළ) චිත්‍ර විෂය පමණක් සමත් වී තිබීම පමණි.

(ආ) සේවක ණය

සභාවේ 1985 සිට 2014 දක්වා කාලය තුළ සේවය කළ සේවකයින් 25 දෙනෙකුගෙන් අයවිය යුතු රු.112,607 ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් අයකර නොතිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 දෙසැම්බර් 21 දිනැති 02/2017 දරන වත්කම් චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව රු.1,298,000 ක වටිනා වාහන 02 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වසර 02ත් වසර 14ත් අතර කාලයක සිට අක්‍රියව පවතින රු.4,607,500 ක් වූ වාහන 07 ක් හා ජල බවුසරයක්, 2022 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය පරිදි අලුත් වැඩියා කර හෝ අපහරණය කර හෝ නොතිබුණි.

(ඇ) 2017 අගෝස්තු 16 දිනැති 04/2017 දරන සබරගමු පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයේ 3.1 ඡේදය අනුව ඉඩම් හා ගොඩනැගිලි සඳහා රජයේ තක්සේරුව ලැබෙන තෙක් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් පත්කළ කමිටුවකින් තක්සේරු කරගත හැකි වේ. එහෙත් ඊට පටහැනිව, සභාපති හා ලේකම් ඇතුළු සාමාජිකයින් සහිත කමිටුවකින් සිදුකළ තක්සේරුවක් මත ඉඩම් 07 ක් හා ගොඩනැගිලි 20 ක් රු.120,381,900කට තක්සේරු කර ගිණුම්ගත කර තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

පහත සඳහන් කරුණු හේතුවෙන් වාර්ෂික අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 34 කට අදාලව එකතුව රු.14,438,500 ක්වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 43 කට අදාලව එකතුව රු.91,657,050 ක්වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 11.26 සිට සියයට 130.67 දක්වා පරාසයක ඉතිරි වීම පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 06 ක රු.896,950 ක්වූ මුළු ප්‍රතිපාදනය ඉක්මවා රු.395,727 ක් වැය කර තිබුණු අතර ඒ සඳහා ප්‍රතිපාදන මාරු කර ගැනීමට හෝ අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙසේ ප්‍රතිපාදන ඉක්මවීම සියයට 13.56 සිට සියයට 160.23 දක්වා පරාසයක පැවතුණි.

ටී.පී.එම්.කුමානායක,

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට.